2. The Requested Party shall surrender the person sought to the competent authorities of the Requesting Party at a location in the territory of the Requested Party acceptable to both Parties.

3. The Requesting Party shall remove the person from the territory of the Requested Party within such reasonable period as the Requested Party specifies and, if the person is not removed within that period, the Requested Party may set that person at liberty and shall inform the Requesting Party and may refuse extradition of the same person for the same offence.

4. If circumstances beyond its control prevent a Party from surrendering or removing the person to be extradited, it shall notify the other Party, and in this case the provisions of paragraph 3 of this Article shall not apply. The Parties shall mutually decide upon a new date of surrender or removal, which shall not be later than sixty (60) days from the date of the decision.

ARTICLE 11

Surrender or Temporary Transfer of Property Relating to an Extradited Person

1. To the extent permitted under the law of the Requested Party and subject to the rights of third States which shall be duly respected, all property found in the Requested Party that has been acquired as a result of the offence or

may be required as evidence shall be surrendered if extradition is granted and the Requesting Party so requests.

2. Subject to paragraph 1 of this Article, the abovementioned property shall, if the Requesting Party so requests, be surrendered to the Requesting Party even if the extradition cannot be carried out, including but not limited to circumstances where the extradition cannot be carried out because of the death, disappearance or escape of the person sought.

3. Where the law of the Requested Party or the rights of third States so require, any articles so surrendered shall be returned to the Requested Party free of charge if that Party so requests.

4. If the abovementioned property is required for an investigation or prosecution of an offence in the Requested Party, then the delivery of that property may be delayed until the completion of the investigation or prosecution, or it may be delivered on condition that it shall be returned after the conclusion of the proceedings in the Requesting Party.

ARTICLE 12

Re-extradition

Where the person extradited has absconded the criminal proceeding against him/her in the requesting State and returned to the territory of the Requested Party, the Requesting Party may submit a request for re-extradition of that person for the same offence.

ARTICLE 13

Rule of Speciality

1. A person extradited under this Treaty may not be detained, tried, or punished in the Requesting Party except for:

a) the offence for which extradition has been granted or a differently denominated offence based on the same facts, on which such extradition was granted, provided such offence is extraditable or is a lesser included offence;

b) an offence in respect of which he/she was extradited, or another offence in respect of which he/she could be convicted based on the proven facts used to support the request for his/her extradition; or

c) an offence for which the competent authority according to the domestic law of the Requested Party consents to the person's detention, trial, or punishment for an offence.

For the purposes of this subparagraph:

i) the Requested Party may require to submit the documents called for in Article 6 of this Treaty;

ii) a copy of the statement, if any, made by the person in respect of whom the extradition is requested shall be submitted to the Requested Party; and

iii) the person extradited may be detained by the Requesting Party for such period of time as the Requested Party may authorize, while the request is being processed.

2. A person extradited under this Treaty may not be extradited to a third State for an offence committed prior to his/her extradition unless the Requested Party consents.

3. Paragraphs 1 and 2 of this Article shall not prevent the detention, trial, or sentence of an extradited person or the extradition of that person to a third State, if:

a) that person leaves the territory of the Requesting Party after extradition and voluntarily returns to it; or

b) that person does not leave the territory of the Requesting Party within sixty (60) days of the day on which that person is free to leave.

ARTICLE 14

Notification of the Results

The Requesting Party shall notify the Requested Party in advance of the information relating to the proceedings against or the execution of sentence upon the person extradited or the re-extradition of that person to a third State.

ARTICLE 15

Transit

1. To the extent permitted by its laws, transferring of a person surrendered to one Party by a third State through the territory of the other Party shall be authorized on the request in writing made through the Central Authorities.

2. Authorization for transit shall not be required when air transport is to be used and no landing is scheduled in the territory of the Party of transit. If an unscheduled landing occurs in the territory of that Party, it may require the other Party to furnish a request for transit as provided in paragraph 1 of this Article. That Party shall detain the person to be transferred until the request for transit is received and the transit is effected, so long as the request is received within four (04) days (96 hours) of the unscheduled landing.

ARTICLE 16

Costs

1. The Requested Party shall meet the costs of any proceedings in its jurisdiction arising out of a request for extradition.

2. The Requested Party shall bear the costs incurred in its territory in connection with the arrest and detention of the person whose extradition is sought, or the seizure and surrender of property.

3. The Requesting Party shall bear the costs incurred in conveying the person whose extradition is granted from the territory of the Requested Party and the costs of transit.

ARTICLE 17

Central Authorities

1. For the purpose of this Treaty, the Parties shall communicate directly through their Central Authorities except provided otherwise in this Treaty.

The Central Authority for the Socialist Republic of Viet Nam shall be the Ministry of Public Security.

The Central Authority for the Democratic Socialist Republic of Sri Lanka shall be the Ministry in charge of the subject of Defence.

2. In case either Party changes its Central Authority, it shall, as soon as practicable, notify the other Party of the same through diplomatic channels.

ARTICLE 18

Settlement of Disputes

1. The Central Authorities shall endeavour to mutually resolve any dispute arising out of the interpretation, application or implementation of this Treaty.

2. If the Central Authorities are unable to resolve the dispute mutually, it shall be resolved through diplomatic channels.

ARTICLE 19

Consultation

1. The Parties shall consult, at the request of either Party, concerning the interpretation and the application of this Treaty.

2. The Ministry of Public Security of the Socialist Republic of Viet Nam and the Ministry in charge of the subject of Defence of the Democratic Socialist Republic of Sri Lanka may consult with each other directly in connection with the processing of individual requests and in furtherance of maintaining and improving procedures for the implementation of this Treaty.

ARTICLE 20

Obligations under other International Agreements

The present Treaty shall not affect the rights and obligations of the Parties arising from other international Agreements to which they are parties.

ARTICLE 21

Amendments

Any amendment or modification to this Treaty agreed to by the Parties shall come into force in the same manner as the Treaty itself.

ARTICLE 22

Entry into Force and Termination

1. This Treaty shall be subject to ratification under the laws of each Party. Each Party shall notify the other as soon as practicable, in writing, through diplomatic channels, upon the completion of its legal procedures required for the entry into force of this Treaty. The Treaty shall come into force on the first day of the second month of the date of the last notification.

2. The Treaty shall remain in force for an indefinite period. It may, however, be terminated by either of the Parties giving a written notice of termination to other Party. The termination shall come into effect six (06) months after the date on which such notice is received by the other Party.

3. Notwithstanding any termination, this Treaty shall continue to apply to the extradition requests made before the date on which such termination takes effect.

IN WITNESS WHEREOF, the undersigned, being duly authorized by their respective States, have signed this Treaty.

Done in duplicate at Colombo. on the 7th day of April 2014, in the Vietnamese, Sinhala and English languages, all texts being equally authentic. In case of any divergence of interpretation, the English text shall prevail.

FOR THE SOCIALIST REPUBLIC OF VIET NAM	**FOR THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**
GENERAL TRAN DAI QUANG MINISTER OF PUBLIC SECURITY	MAJOR GENERAL NANDA MALLAWARACHI SECRETARY OF THE MINISTRY OF LAW AND ORDER

වියට්නාම් සමාජවාදී ජනරජය

සහ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

අතර

උදාර්පණය

පිළිබඳ ගිවිසුම

වියට්නාම සමාජවාදී ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර උදර්පණය පිළිබඳ ගිවිසුම

මෙහි මින් මතු, වෙන් වෙන් වශයෙන් ගත් කළ පාර්ශ්වය ලෙස හා සාමූහික වශයෙන් ගත් කළ පාර්ශ්ව ලෙස හඳුන්වනු ලබන, වියට්නාම සමාජවාදී ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය;

සාපරාධී කටයුතු වැළැක්වීම සඳහා සහ මැඩපැවැත්වීම සඳහා දෙරට අතර වඩාත් ඵලදායී සහයෝගිතාවක් ඇතිකිරීමේ සහ උදර්පණය පිළිබඳ ගිවිසුමකට එළඹීමෙන් උදර්පණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දෙරට අතර සබඳතා සඳහා පහසුකම් සැලසීමේ අභිලාෂයෙන්;

මෙසේ ගිවිස ගනිති.

–

1 වැනි වගන්තිය

උදර්පණය සඳහා බැඳීම

එක් එක් පාර්ශ්වය, උදර්පණීය වරදක් සඳහා නඩු පැවරීම, නඩු විභාග කිරීම හෝ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම සඳහා එම පාර්ශ්වයේ දේශය තුළ සිටින හා අනෙක් පාර්ශ්වය විසින් සොයා ගැනීමට අපේක්ෂා කරන යම් පුද්ගලයකු, එම වැරැද්ද, මෙම ගිවිසුම බලාත්මකවීමට පෙරාතුව සිදු කළද, ඉන් පසුව සිදු කළ ද, මෙම ගිවිසුමේ විධිවිධානවලට හා අදාළ එක් එක් රටවල නීති ප්‍රකාරව අනෙක් පාර්ශ්වය, උදර්පණය කිරීමට එකඟ වෙයි.

2 වැනි වගන්තිය

උදර්පණීය වැරදි

1. මෙම ගිවිසුමේ කාර්යාර්ථයන් සඳහා උදර්පණීය වැරදි වනුයේ, ඉල්ලීම කරන අවස්ථාවේදි අඩුම තරමින් එක් (01) අවුරුද්දක කාලසීමාවක් සඳහා සිරදඬුවම් ලබා දීමෙන් හෝ ඊට වඩා බරපතල දණ්ඩනයක් ලබා දීමෙන් හෝ දෙපාර්ශ්වයේ ම නීති ප්‍රකාරව දඬුවම් ලබා දිය යුතු වන වැරදි වේ.

2. මෙම වගන්තියේ 1 ඡේදයේ දැක්වෙන වරදක් සම්බන්ධයෙන් කුමන්ත්‍රණය කිරීමට තැත්කිරීමක්, වරද සිදු කිරීමට ආධාර හෝ අනුබලදීමක් හෝ හවුල්කරුවෙකු වීමක් වන්නේ නම්, උදර්පණීය වරදක් විය යුතුය.

3. උදර්පණ ඉල්ලීම, යම් උදර්පණීය වැරැද්දක් සඳහා ඉල්ලීම කරන පාර්ශ්වයේ අධිකරණයක් මඟින් සිරදඬුවම් නියම කරන ලද පුද්ගලයෙකු හා සම්බන්ධයෙන් වන

කල්හි, නියම කරන ලද දඬුවම විඳීමට අඩුම තරමින් මාස හයක (06) කාලසීමාවක්වත් ඉතිරිව ඇත්නම් පමණක් උදර්පණය සිදු කළ යුතුය.

4. මෙම වගන්තියේ අරමුණු සඳහා යම් වරදක්, දෙපාර්ශ්වයේම නිතිවලට පටහැනිවන වරදක් වනවාද යන්න නිශ්චය කිරීමේදී,

ඇ) පාර්ශ්වවල නිති මඟින්, වැරැද්දට අදාළ වන හැසිරීම එකම ප්‍රවර්ගයක් යටතේ වර්ග කොට නොදැක්වුවද, එම වරද එකම නාමාවලියක් යටතේ නම් කොට නොදැක්වුවද කම් නැත.

ඈ) උදර්පණයට යටත් වන පුද්ගලයා සිදු කරනු ලැබුවා යැයි කියන හැසිරීම් සියල්ලම පාර්ශ්වවල නිති ප්‍රකාරව සැළකිල්ලට ගත යුතුය.

5. බදුකරණය, විදේශ විනිමය පාලනය හෝ වෙනත් ආදායම් කටයුත්තක් සම්බන්ධයෙන් වන නීතියකට පටහැනි වරදක් සඳහා පුද්ගලයකු උදර්පණය කිරීම අපේක්ෂා කරන අවස්ථාවකදී, ඉල්ලීම කරන පාර්ශ්වයේ නිති මෙන් ඉල්ලීම ලබන පාර්ශ්වයේ නීතිය මඟින් ඒ සමාන ආකාරයේම බදු නොපනවයි සහ එහි ඒ සමාන ආකාරයේ බද්දක් හෝ විනිමය රෙගුලාසි නොපවතියි යන හේතු මත උදර්පණය ප්‍රතික්ෂේප නොකළ යුතුය.

6. වරද, ඉල්ලීම කරන පාර්ශ්වයේ දේශයෙන් පිටතදී සිදු කොට ඇති අවස්ථාවකදී, ඊට සමාන තත්ත්ව යටතේදීම ඉල්ලීම ලබන පාර්ශ්වයේ දේශයෙන් පිටතදී සිදු කරනු ලැබූ වැරැද්දක් සඳහා දඬුවම් ලබා දීම සඳහා එහි නීතිය විධිවිධාන සලසන අවස්ථාවලදී උදර්පණය කළ යුතුය. ඉල්ලීම කරන පාර්ශ්වයේ නීතිය එසේ විධි විධාන නොසලකන අවස්ථාවලදී, ඉල්ලීම ලබන පාර්ශ්වයේ අභිමතය පරිදි උදර්පණය සිදු කළ හැකිය.

7. උදර්පණය සඳහා කරනු ලබන ඉල්ලීමෙහි වැරදි කිහිපයක් සඳහන් වී ඇත්නම් මේ එක් එක් වැරැද්ද දෙපාර්ශ්වයේම නිති ප්‍රකාරව දඬුවම් ලබා දිය යුතු වැරදි වුවද, මෙම වැරදි වලින් සමහරක්, මෙම වගන්තියේ 1 හා 2 ඡේදවල නිශ්චිතව දක්වා ඇති වෙනත් කොන්දේසි නොසපුරාලයි නම්, මෙම පුද්ගලයා අඩුතරමින් එක් උදර්පණය වරදක් සඳහාවත් උදර්පණය කළ යුතුව ඇත්නම් උදර්පණය කළ හැකිය.

3 වැනි වගන්තිය

උදර්පණය ප්‍රතික්ෂේප කිරීම

පහත සඳහන් කිසිදු තත්ත්වයක් යටතේ උදර්පණය සිදු නොකළ යුතුය.

1. අ) උදර්පණයට යටත් වන පුද්ගලයා, ඉල්ලීම ලබන පාර්ශ්වයේ පුරවැසියෙකු වන්නේ නම්,

ආ) උදර්පණයට යටත් වන පුද්ගලයාට, ඉල්ලීම ලබන පාර්ශ්වයේ සීමාකර ව්‍යවස්ථාව යටතේ කල් ඉකුත් වීම හේතු කොට ගෙන නඩු පැවරිය නොහැකි නම්,

ඇ) නඩු පැවරීම සඳහා උදර්පණයට යටත්වන පුද්ගලයා, ඉල්ලීම හා සම්බන්ධව හැසිරීම සඳහා ශක්නුවත් අධිකරණය මඟින් ලබා දෙනු ලබන අවසාන විනිශ්චයක් යටතේ වැරැදිකරුවෙකු බවට පත් කොට ඇත්නම් හෝ ඉල්ලීම ලබන පාර්ශ්වයේ අපරාධ පටිපාටි නීතිය ප්‍රකාරව එම නඩුව අස් කරගෙන ඇත්නම්,

ඈ) උදර්පණය සඳහා වන ඉල්ලීම වැරදි එකකට වඩා වැඩි ගණනක් හා සම්බන්ධ වන හා මේ එක් එක් වැරදි ද ඉල්ලීම කරන පාර්ශ්වයේ නීති යටතේ දඬුවම් ලබා දිය යුතු වැරදි වුවද, මෙම ගිවිසුමේ 2 වැනි වගන්තිය යටතේ නොදක්වන්නේ නම්,

ඉ) උදර්පණය සඳහා ඉල්ලීම සිදු කිරීමට හේතු වන වරදක් හමුදා ක්ෂේත්‍රයට හා සම්බන්ධ නම්,

ඊ) ඉල්ලීම ලබන පාර්ශ්වයේ මතය අනුව, උදර්පණයට යටත් වන පුද්ගලයාට, ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂභාවය, පුරවැසිභාවය, සමාජ තත්ත්වය හෝ දේශපාලන ආකල්ප යන ඒවා හේතු කොට ගෙන නඩු පැවරීමේ හෝ දඬුවම් ලබා දීමේ අරමුණින් උදර්පණය සඳහා ඉල්ලීම ඉදිරිපත් කර ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවති නම්,

2. පහත සඳහන් යම් තත්ත්වයක් යටතේ උදර්පණය ප්‍රතික්ෂේප කළ හැකිය.

අ) උදර්පණය සිදු කිරීම සඳහා කරන ඉල්ලීමට හේතු වන වරද සම්බන්ධයෙන් ඉල්ලීම ලබන පාර්ශ්වයට එහි නීති ප්‍රකාරව අධිකරණ බලයක් තිබේ. මෙවැනි අවස්ථාවකදී ඉල්ලීම ලබන පාර්ශ්වයේ ශක්නුවත් බලධාරියා උදර්පණය කිරීමට අපේක්ෂා කරන පුද්ගලයාට එරෙහිව පටිපාටිකරය සැකසිය යුතුය.

ආ) උදර්පණයට යටත්වන පුද්ගලයා, ඉල්ලීම ලබන පාර්ශ්වයේදී ඉල්ලීමට හේතු කාරක වන වරද සඳහා අභියෝදනා කරනු ලබමින් සිටියි නම්

3. උදර්පණය ප්‍රතික්ෂේප කරන අවස්ථාවලදී, ඉල්ලීම ලබන පාර්ශ්වය එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සඳහා හේතු ද සමඟින් සාධාරණ කාල සීමාවක් තුළදී ලිඛිතව ඒ බව ඉල්ලීම කරන පාර්ශ්වය වෙත දැනුම් දිය යුතුය.

4 වැනි වගන්තිය

උදර්පණය කල් දැමීම හා තාවකාලික උදර්පණය

1. උදර්පණය ඉල්ලා සිටිනු ලබන වරද හැර වෙනත් වරදකට ඉල්ලීම ලබන පාර්ශ්වයේ උදර්පණයට යටත් වන පුද්ගලයා පිළිබඳ විමර්ශණ කටයුතු, නඩු පැවරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතියි නම් හෝ නඩු විභාග කර දඬුවමක් විදිමින් සිටියි නම් හෝ නඩු කටයුතු අවසන් වන තුරු හෝ පනවන ලද දඬුවම පූර්ණ වශයෙන් හෝ කොටසක් හෝ විඳ අවසන් වන තුරු ඉල්ලීම ලබන පාර්ශ්වයට උදර්පණයට යටත් වන පුද්ගලයාගේ උදර්පණය කල් දැමිය හැකිය. යම් කල් දැමීමක් පිළිබඳව ඉල්ලීම ලබන පාර්ශ්වය, ඉල්ලීම කරන පාර්ශ්වය වෙත දන්වා සිටිය යුතුය. කල් දැමීමේ කොන්දේසි තව දුරටත් අදාළ නොවන විට ඉල්ලීම ලබන පාර්ශ්වය ප්‍රායෝගික වශයෙන් හැකි වූ වහාම ඉල්ලීම කරන පාර්ශ්වය වෙත දන්වා සිටිය යුතු අතර ඉල්ලීම ලබන පාර්ශ්වය වෙනත් ආකාරයකින් දන්වා නොමැත්තේ නම් උදර්පණ ක්‍රියාවලිය නැවත ආරම්භ කළ යුතුය.

2. 1 ඡේදයේ දැක්වෙන උදර්පණය කල් දැමීම මඟින් කල් ඉකුත් වීම හේතුකොට ගෙන හෝ නඩු කටයුතු සඳහා බරපතල දුෂ්කරතාවය මතු කිරීම හේතු කොට ගෙන සාපරාධී නඩු කටයුතුවලට බාධා පමුණුවන අවස්ථාවකදී, ඉල්ලීම ලබන පාර්ශ්වය ඉල්ලීම කරන පාර්ශ්වයේ ඉල්ලීම මත හා එහි පවත්නා නීති ප්‍රකාරව උදර්පණයට යටත් වන පුද්ගලයා තාවකාලිකව උදර්පණය කළ හැකිය.

3. තාවකාලික උදර්පණයට යටත්වන පුද්ගලයා සාපරාධී නඩු කටයුතු සම්පූර්ණ කළ වහාම හෝ තාවකාලික උදර්පණය සඳහා අවසර ලබා දුන් අන්‍යෝන්‍ය වශයෙන් එකඟතාවයට පත් කාලය අවසන් වූ වහාම ආපසු භාර දිය යුතුය. කාල සීමාව දිර්ඝ කිරීම සඳහා සාධාරණ හේතු පවතිනවා යැයි සලකනු ලබන්නේ නම්, ඉල්ලීම මත මූලික වශයෙන් එකඟතාවයට පත් කාලසීමාව ඉල්ලීම ලබන පාර්ශ්වයට දිර්ඝ කළ හැකිය.

5 වන වගන්තිය

පුරවැසියන් උදර්පණය කිරීම

1. පාර්ශ්ව දෙකෙන් කිසිදු පාර්ශ්වයක්, මෙම ගිවිසුම යටතේ තම පුරවැසියන් උදර්පණය කිරීමට බැඳීමක් ඇති නොකර ගත යුතුය.

2. උදර්පණයට ලක් වන පුද්ගලයාගේ පුරවැසිභාවය පදනම් කරගනිමින් පමණක් උදර්පණය ප්‍රතික්ෂේප කරයි නම්, ඉල්ලීම ලබන පාර්ශ්වය, ඉල්ලීම කරන පාර්ශ්වයේ ඉල්ලීම මත, දෙපාර්ශ්වයේම ජාතික නීතිවලට අනුකූලව අභිචෝදනය සඳහා තම බලධාරීන් වෙත මෙය ඉදිරිපත් කළ යුතුය.

3. උදර්පණය ඉල්ලා සිටිනු ලබන වරද සිදු කරන අවස්ථාවේදී ඔහු සතු වූ ඔහුගේ පුරවැසිභාවය පුරවැසිභාවය ලෙස සැළකිය යුතුය.

6 වැනි වගන්තිය

උදර්පණ පටිපාට

1. මෙම ගිවිසුම යටතේ සිදු කරන උදර්පණ ඉල්ලීම් ලිඛිතව සිදුකළ යුතු අතර, මෙම ගිවිසුමේ 14 වැනි වගන්තියේ අර්ථ දක්වා ඇති මධ්‍යම බලධාරීන් හරහා හුවමාරු කර ගත යුතුය. උදර්පණ ඉල්ලීමෙහි පහත දැක්වෙන තොරතුරු ඇතුළත් කළ යුතුය.

අ) ඉල්ලීම කරන දිනය හා ස්ථානය;

ආ) උදර්පණය සඳහා ඉල්ලා සිටීමට හේතු;

ඇ) උදර්පණය ඉල්ලා සිටින ශක්නුවත් බලධාරියාගේ නම සහ ලිපිනය;

ඈ) උදර්පණ ඉල්ලීම ලබන ශක්නුවත් බලධාරියාගේ නම හා ලිපිනය සහ

ඉ) උදර්පණයට යටත් වන පුද්ගලයා පිළිබඳ අවශ්‍ය තොරතුරු, විශේෂයෙන් ඔහුගේ හෝ ඇයගේ නම, ස්ත්‍රී/ පුරුෂභාවය, උපන් දිනය, පුරවැසිභාවය සහ පදිංචිය

2. මෙම ඉල්ලීම සමඟ පහත දැක්වෙන ලිපිලේඛන ද ඉදිරිපත් කල යුතුය.

අ) නඩුවේ කරුණු පිළිබඳ ප්‍රකාශයක්

ආ) අත්‍යවශ්‍ය කරුණු සහ වරදේ ස්වභාවය, වරද සඳහා දඬුවම සහ නඩු පැවරීම සඳහා කාලසීමාව තෙක් පනවන ලද දඬුවම බලාත්මක කිරීම විස්තර කරන ප්‍රකාශයක්

ඇ) උදර්පණයට යටත්වන පුද්ගලයාගේ පුරවැසිභාවය සහ පදිංචිය සහතික කරන ලියකියවිලි ඇත්නම්; සහ

ඈ) අනන්‍යතාවය විස්තර කෙරෙන ලියකියවිලි හා උදර්පණයට යටත්වන පුද්ගලයාගේ ජායාරූපයක් (ඇත්නම්)

3. මෙම ඉල්ලීම වුදිතයෙකුට අදාළව සිදු කෙරෙන්නේ නම්, ඒ සමඟ පහත ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

අ) ඉල්ලීම කරන පාර්ශ්වයේ ශක්නුවත් බලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන අත්අඩංගුවට ගැනීමේ හෝ රඳවා තබා ගැනීමේ වරෙන්තු පිටපතක්.

ආ) සොයා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා, අත්අඩංගුවට ගැනීමේ හෝ රඳවා තබා ගැනීමේ වරෙන්තුවෙහි සඳහන් වන පුද්ගලයාම බවට සහතික කෙරෙන ලේඛණයක්

4. දැනටමත් වරදකරුවෙකු බවට ඔප්පු කොට දඬුවම් නියම කර ඇති අයෙකුට අදාළව මෙම ඉල්ලීම සිදුකෙරෙන්නේ නම්, පහත ලියවිලිද ඉදිරිපත් කළ යුතුය.

අ) ඉල්ලීම කරන පාර්ශ්වයේ අධිකරණයක් විසින් ඔහු වරදකරුවෙකු බවට තීන්දු කළ නඩු තීන්දුවේ පිටපතක්

ආ) එම තීන්දුව අවසාන තීන්දුව බවටත්, තවදුරටත් නඩු කටයුතු සිදු නොකරන බවටත්. දඬුවමන් තව දුරටත් විඳීමට ඉතිරිව ඇති ප්‍රමාණය කොතෙක්දැයි බවටත් පෙන්නුම් කෙරෙන ප්‍රකාශයක්

5. උදර්පණ ඉල්ලීම සහ අනෙකුත් ලිපි ලේඛණ, ඉල්ලීම කරන පාර්ශ්වයේ ශක්නුවත් නිලධාරියා හා බලධාරියා විසින් අත්සන් කොට මුදා තැබිය යුතුය. එවැනි ලේඛණවල මුල් පිටපත් හෝ සත්‍ය පිටපත් සත්‍ය බවට නැවත සහතික කිරීම අවශ්‍ය නොවේ.

6. වරදකරුවෙකු වූ පුද්ගලයෙකු නඩු විභාගය සඳහා ඉදිරිපත් නොවූ අවස්ථාවකදී, මෙම වගන්තියේ 4 වන ඡේදයේ අරමුණ අනුව, එම පුද්ගලයා සිදු කළ වරදට ඔහු/ ඇය වෝදනා ලැබ ඇති සේ සැළකිය යුතුය.

7. මෙම ගිවිසුමේ අරමුණු සඳහා ඉදිරිපත් කර ඇති සාක්ෂි හෝ ලබා දී ඇති තොරතුරු, මෙම ඉල්ලීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී ඒ සඳහා තීරණයක් ගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ යැයි ඉල්ලීම ලබන පාර්ශ්වය අදහස් කරන විටෙක, ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් ලබා දෙන කාල සීමාව ඇතුලත අමතර සාක්ෂි හා තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

8. උදර්පණ ඉල්ලීම සහ ඊට අදාළ අනෙකුත් ලිපි ලේඛණ, ඉල්ලීම ලබන පාර්ශ්වයේ නිල භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර, සහතික කර ඉදිරිපත් කළ යුතුය.

7 වැනි වගන්තිය

අතිරේක තොරතුරු

1. මෙම ගිවිසුමේ ප්‍රකාරව උදර්පණ ඉල්ලීම වෙනුවෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු උදර්පණය සිදු කිරීමට තරම් ප්‍රමාණවත් නොවේ යැයි ඉල්ලීම ලබන පාර්ශ්වය අදහස් කරන විට, නියම කරන ලද කාල සීමාව ඇතුළත අතිරේක තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමට රට හැකියාව ඇත.

2. උදර්පණයට යටත් වන පුද්ගලයා අත් අඩංගුවෙහි පසුවේ නම් සහ සපයා ඇති අතිරේක තොතුරු මෙම ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාණවත් නොවේ නම් හෝ නියම කරන ලද කාල සීමාව තුළ එම අතිරේක තොරතුරු ලැබී නොමැති නම්, එම පුද්ගලයා අත් අඩංගුවෙන් මුදා හැරිය හැකියි. එවැනි මුදා හැරීමක් මගින් එම පුද්ගලයා සම්බන්ධයෙන් උදර්පණය සඳහා නව ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට, ඉල්ලීම කරන පාර්ශ්වයට බාධාවක් ඇති නොවිය යුතුය.

3. 2 වන පරිච්ඡේදයට අනුව එවැනි පුද්ගලයෙකු අත්අඩංගුවෙන් මුදා හැරී විටෙක, ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින් ඒ බව ඉල්ලීම කරන පාර්ශ්වය වෙත දැන්විය යුතුය.

8 වැනි වගන්තිය

තාවකාලිකව අත්අඩංගුවට ගැනීම

1. හදිසි අවස්ථාවකදී උදර්පණ ඉල්ලීම ඉදිරිපත් කරන තුරු, අපරාධ පිළිබඳ අන්තර්ජාතික පොලිස් සංවිධානය (ඉන්ටපෝල්), රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ හෝ සෘජුවම මධ්‍යම බලධාරීන් ඔස්සේ අදාළ පුද්ගලයා තාවකාලිකව අත් අඩංගුවට ගැනීම සඳහා අයදුම් කළ හැකිය.

අයදුම්පත ලිඛිතව සකස් කළ යුතු අතර විද්‍යුත් මාධ්‍ය ඇතුළු ඕනෑම මාධ්‍යයක් මගින් යැවිය හැකිය.

2. අයදුම්පතෙහි පහත ලේඛණ ඇතුළත් විය යුතුය.

අ) අයදුම්පත හදිසියේ සකස් කිරීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්

ආ) සොයා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා පිළිබඳ විස්තරයක්; හැකිනම් ඔහුගේ/ ඇයගේ ඡායාරූපයක් හෝ ඇඟිලි සළකුණු සහිතව

ඇ) සොයා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා සිටින ස්ථානය දන්නේ නම්; ඒ පිළිබඳව

ඈ) එම පුද්ගලයා විසින් කරන ලදැයි කියනු ලබන හෝ ඔහු හෝ ඇය විසින් වෝදනා ලැබ තිබෙන වැරදි පිළිබඳව ප්‍රකාශයක්

ඉ) එක් එක් වරද සිදුකිරීමේදී පැවතියා යැයි කියනු ලබන ඔහුගේ හැසිරීම පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක්

ඊ) සොයා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයාට විරුද්ධව අත් අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් තිබීම, හෝ වරද සොයා ගැනීම හෝ ඔහු වරදකරුවෙකු බවට තීන්දු කළ විනිශ්චය පිළිබඳ ප්‍රකාශයක්

උ) වරද සඳහා පැනවිය හැකි හෝ එසේ පනවන ලද දඬුවම පිළිබඳ ප්‍රකාශයක් සහ

ඌ) පුද්ගලයා උදර්පණය කිරීම සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කරන බවට ප්‍රකාශයක්

3. එවැනි අයදුම්පතක් ලැබුණු විට, ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් අදාළ පුද්ගලයා අත් අඩංගුවට ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු අතර, ප්‍රායෝගික වශයෙන් හැකි ඉක්මණින් අයදුම්පතෙහි ප්‍රතිඵල පිළිබඳව ඉල්ලීම කරන පාර්ශ්වය වෙත දැනුම් දිය යුතුය.

4. එවැනි අයදුම්පතක් මත පුද්ගලයෙකු අත්අඩංගුවට ගත් පසුව, මෙම ගිවිසුමෙහි 6 වන වගන්තියෙහි දක්වා ඇති ලියකියවිලි සහිතව උදර්පණය සඳහා වන ඉල්ලීම නොලැබුණහොත්, අත්අඩංගුවට ගැනීමෙන් දින 60ක් ඉක්ම වූ විට ඔහුව නිදහස් කළ හැකිය.

5. 4 වන පරිච්ඡේදයට අනුකූලව පුද්ගලයෙකු මුදා හැරීම තුළින්, උදර්පණ ඉල්ලීම පසුව ලැබුණහොත් එම පුද්ගලයාව උදර්පණය කිරීමේ කටයුතු වලින් ආයතනය වැළැක්වීමක් සිදු නොවිය යුතුය.

9 වැනි වගන්තිය

සමගාමී ඉල්ලීම්

1. එකම වරදක් හෝ විවිධ වැරදි සම්බන්ධයෙන් එකම පුද්ගලයෙකු උදර්පණය සඳහා රටවල් දෙකකින් හෝ වැඩි ගණනක් මගින් ඉල්ලුම් කර ඇති විටෙක, එම රටවලින් කුමන රටකට එම පුද්ගලයා උදර්පණය කළ යුතුදැයි ඉල්ලීම ලබන පාර්ශ්වය තීරණය කළ යුතු අතර, එම තීරණය පිළිබඳව එම රටවල්වලට දැනුම් දිය යුතු වන්නේය.

2. පුද්ගලයෙකු උදර්පණය කළ යුත්තේ කුමන රටකට දැයි තීරණය කිරීමේදී, ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් ඒ සඳහා පහත සාධක ඇතුළුව, එහෙත් එම සාධක වලට පමණක් සීමා නොවූ, අදාළ සියළුම සාධක සැලකිල්ලට ගත යුතුය.

අ) උදර්පණයට යටත් වන පුද්ගලයාගේ පුරවැසිභාවය හා සාමාන්‍යයෙන් ඔහු පදිංචි වී සිටින ස්ථානය

ආ) ගිවිසුම් ප්‍රකාරව ඉල්ලීම සිදුකර ඇත්ද යන බව

ඇ) එක් එක් වරද සිදු කරනු ලැබූ වේලාව හා ස්ථානය

ඈ) ඉල්ලීම කරන රටවලට අදාළ අභිලාෂයන්

ඉ) වරදේ බරපතළකම

ඊ) පීඩාවට පත්/ අනතුරට පත් අයගේ පුරවැසිභාවය

උ) ඉල්ලීම කරන පාර්ශ්වයන් අතර තව දුරටත් උදර්පණය කිරීමේ හැකියාව; සහ

ඌ) ඉල්ලීම්වලට අදාළ දිනයන්

10 වන වගන්තිය

භාර දීම

1. උදර්පණය සඳහා කරන ලද ඉල්ලීම පිළිබඳව තීරණයක් ගත් විගාම, එම තීරණය පිළිබඳව ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් රාජ්‍යතාන්ත්‍රික මාර්ග හරහා ඉල්ලීම කරන පාර්ශ්වයේ මධ්‍ය අධිකාරිය වෙත එම තීරණය දැනුම් දිය යුතුය. උදර්පණය සඳහා කළ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන අවස්ථාවකදී ඒ සඳහා හේතු ඉදිරිපත් කළ යුතුය.

2. දෙපාර්ශ්වයටම පිළිගත හැකි වන, ඉල්ලීම ලබන පාර්ශ්වයේ භූමි ප්‍රදේශයක පිහිටි ස්ථානයකදී, ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් උදර්පණයට යටත් වන පුද්ගලයා ඉල්ලීම කරන පාර්ශ්වයේ ශක්නුවත් බලධාරීන් වෙත භාර දිය යුතුය.

3. ඉල්ලීම කරන පාර්ශ්වය විසින් ඉල්ලීම ලබන පාර්ශ්වය නියම කරන සාධාරණ කාල සීමාවක් තුළදී උදර්පණයට යටත් වූ පුද්ගලයා ඉල්ලීම ලබන පාර්ශ්වයේ භූමි ප්‍රදේශයෙන් ඉවත් කර ගත යුතුය. අදාල කාල සීමාව තුළදී එම පුද්ගලයා ඉවත් කර නොගත්තේ නම්, ඔහු නිදහස් කිරීමට ඉල්ලීම ලබන පාර්ශ්වයට හැකි වන අතරම, ඉල්ලීම කරන පාර්ශ්වය වෙත ඒ බව දැනුම් දිය යුතු සේම එම පුද්ගලයාව එම වරදටම නැවත උදර්පණය කිරීම ප්‍රතික්ෂේප කිරීමටද හැකියාව ඇත.

4. යම් පාර්ශ්වයකට, සිය පාලනයෙන් පරිබාහිර තත්ත්වයන් නිසා උදර්පණයට යටත් වන පුද්ගලයා භාර ගැනීම හෝ ඉවත් කර ගැනීමට බාධා පැමිණේනම්, එම පාර්ශ්වය විසින් ඒ බව අනෙක් පාර්ශ්වය වෙත දැනුම් දිය යුතු වන අතර, මෙවැනි අවස්ථාවකදී මෙම වගන්තියේ 3 වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ නොවේ. භාර කිරීමේ හෝ ඉවත් කිරීමේ නව දිනයක් පිළිබඳව පාර්ශ්ව විසින් අනෙකෝන්‍ය වශයෙන් එකඟතාවයකට එළඹිය යුතු අතර, එම දිනය තීරණය ගත් දින සිට දින හැටක් (60) නොඉක්මවීමට පෙර දිනයක් විය යුතුය.

11 වන වගන්තිය

උදර්පණයට යටත් වන පුද්ගලයාට අදාළ දේපළ භාරදීම හෝ තාවකාලිකව පැවරීම

1. ඉල්ලීම ලබන පාර්ශ්වයේ නීතියට අනුව අවසර දී ඇති ප්‍රමාණයට හා නිසි ගෞරවය ලබා දිය යුතු තුන් වන රටවල්වල අයිතිවාසිකම්වලට යටත්ව, වරද සිදුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස අත්කර ගෙන ඇති හෝ සාක්ෂි ලෙස ඉල්ලා සිටිය හැකි ඉල්ලීම ලබන පාර්ශ්වයේ දී සොයා ගත් සියළු දේපළ, උදර්පණය සිදු කළහොත් හා ඉල්ලීම කරන පාර්ශ්වය විසින් එසේ ඉල්ලා සිටියහොත් භාර දිය යුතුය.

2. මෙම වගන්තියේ 1 වන පරිච්ඡේදයට අනුකූලව, ඉහත සඳහන් දේපළ ඉල්ලීම කරන පාර්ශ්වය විසින් එසේ ඉල්ලා සිටියහොත්, උදර්පණයට යටත් වන පුද්ගලයාගේ මරණය, අතුරුදන් වීම, පලා යෑම නිසා උදර්පණය ක්‍රියාත්මක කළ නොහැකි වීම ඇතුළු, එහෙත් ඊට පමණක් සීමා නොවූ, උදර්පණය ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථාවන්හිදී පවා, ඉල්ලීම කරන පාර්ශ්වය වෙත භාර දිය යුතුය.

3. ඉල්ලීම ලබන පාර්ශ්වයේ නීතිය මගින් හෝ තුන්වන රටවල්වල අයිතිවාසිකම් මගින් ඉල්ලා සිටින විට, එසේ භාර ගත් ද්‍රව්‍ය ඉල්ලීම ලබන පාර්ශ්වය වෙත, එම පාර්ශ්වය විසින් ඉල්ලා සිටින්නේ නම් නොමලේ ආපසු භාර දිය යුතුය.

4. ඉහත සඳහන් කළ දේපළ ඉල්ලීම ලබන පාර්ශ්වයේදී වරද විමර්ශනය කිරීම හෝ අභිචෝදනය සඳහා අවශ්‍ය වන්නේ නම්, එම දේපළ භාරදීම විමර්ෂණය හෝ අභිචෝදනය අවසන් වන තුරු පමා කළ හැකි වන අතර, නොඑසේ නම් ඉල්ලීම කරන පාර්ශ්වයේ කාර්යයන් අවසන් වීමෙන් පසුව ආපසු ලැබෙන්නට සැළැස්වීමේ කොන්දේසියට යටත්ව ඒවා භාර දිය හැකිය.

12 වන වගන්තිය

නැවත උදර්පණය කිරීම

උදර්පණයට යටත් වූ පුද්ගලයා විසින් ඉල්ලීම කරන රටේ ඔහුට විරුද්ධව ඇති සාපරාධී නඩු කටයුතු මග හැර, ඉල්ලීම ලබන රටේ දේශ සීමාව වෙත ආපසු ගොස් ඇති අවස්ථාවකදී, ඉල්ලීම කරන පාර්ශ්වයට එම පුද්ගලයා එම වරද සඳහාම නැවත උදර්පණය කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය.

13 වන වගන්තිය

වෙසෙසියාව සම්බන්ධ නීතිය

1. අ) උදර්පණය සිදු කිරීම සඳහා වූ වරද හෝ උදර්පණය සිදු කිරීම සඳහා වූ, එම තොරතුරු මෙම පදනම් වූ වෙනත් ආකාරයෙන් හඳුන්වා දෙන ලද වරදක්, උදර්පණීය වරදක් හෝ අඩු අන්තර්ගතයකින් යුතු වරදක් සිදු කිරීම,

ආ) ඔහු/ ඇය උදර්පණය කිරීමට හේතු වූ වරද හෝ ඔහු/ ඇය උදර්පණය කිරීම සඳහා කරන ලද ඉල්ලීම සනාථ කිරීමේදී භාවිත කරන ලද, ඔප්පු කළ හැකි සාධක පදනම් කරගෙන ඔහු/ ඇය වරදකරුවෙකු බවට පත් කළ හැකි වෙනත් වරදක් සිදු කිරීම,

ඇ) වරදක් සඳහා පුද්ගලයා රඳවා තබා ගැනීම, ඔහුට/ ඇයට විරුද්ධව නඩු විභාග කිරීම හෝ දඬුවම් ලබා දීම සඳහා ඉල්ලීම ලබන පාර්ශ්වයේ දේශීය නීතියට අනුකූලව ශක්‌තුවත් බලධාරියා කැමැත්ත පල කර ඇති වරදක් සිදු කිරීම හැර

වෙනත් හේතුවක් නිසා පුද්ගලයෙකු රඳවා තබාගැනීම, ඔහුට/ ඇයට විරුද්ධව නඩු විභාග කිරීම හෝ දඬුවම් ලබා දීම හෝ නොකළ යුතුය.

මෙම අනු ඡේදයේ අරමුණු අරභයා -

(i) ඉල්ලීම ලබන පාර්ශ්වයට මෙම ගිවිසුමේ 6 වන වගන්තියෙන් ඉල්ලා ඇති ලේඛන ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය හැකිය.

(ii) උදර්පණය කරනු ලැබීමට නියමිත පුද්ගලයා විසින් ප්‍රකාශයක් කර ඇත්නම්, එහි පිටපතක් ඉල්ලීම ලබන පාර්ශ්වය වෙත ඉදිරිපත් කළ යුතුය.

(iii) උදර්පණය සිදුවෙමින් පවතිද්දී ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් අනුමත කරන ලද කාලපරිච්ඡේදයක් තුළ ඉල්ලීම කරන පාර්ශ්වයට උදර්පණය කරනු ලබන පුද්ගලයා රඳවා තබා ගත හැකිය.

2. ඉල්ලීම ලබන පාර්ශ්වය කැමැත්ත ලබා දී ඇත්නම් මිස එසේ නොමැති නම්, උදර්පණය කරනු ලබන පුද්ගලයා විසින් කලින් සිදුකරන ලද වරදක් සම්බන්ධයෙන් ඔහු/ ඇය තුන්වන රාජ්‍යයකට උදර්පණය නොකළ යුතුය.

3. අ) පුද්ගලයා උදර්පණයෙන් පසුව හා ස්වේච්ඡාවෙන් ඉල්ලීම කරන පාර්ශ්වයේ දේශය අත්හැර යන්නේ නම් හෝ

ආ) එම පුද්ගලයාට එම දේශය අත හැර යාමට අවසර ලැබී දින හැටක් (60) ක් තුළ ඔහු/ ඇය එම දේශය අත්හැර නොයන්නේ නම්,

එම පුද්ගලයා රඳවා තබා ගැනීම, ඔහුට/ ඇයට විරුද්ධව නඩු විභාග කිරීම හෝ දඬුවම් පැමිණවීම හෝ තුන්වන රාජ්‍යයක් විසින් එම පුද්ගලයා උදර්පණය කරනු ලැබීම මෙම ගිවිසුමේ 1වන හා 2 වන ඡේද යටතේ වැළැක්විය යුතු නොවේ.

14 වැනි වගන්තිය

ප්‍රතිවල දැනුම්දීම

උදර්පණය ලද පුද්ගලයාට විරුද්ධව කරනු ලබන කාර්ය කටයුතු හා දණ්ඩන නියමය ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු හා ඔහු/ ඇය තුන්වන රාජ්‍යයකට උදර්පණය කිරීම පිළිබඳ තොරතුරු ඉල්ලීම ලබන පාර්ශ්වය වෙත කල් ඇතිව දැනුම් දිය යුතුය.

15 වැනි වගන්තිය

සංක්‍රාන්තිය

1. එක් පාර්ශ්වයක් විසින් භාර දෙන ලද පුද්ගලයෙකු තුන්වන රාජ්‍යයක් විසින්, අනෙක් පාර්ශ්වයේ දේශය හරහා මාරු කිරීම, මධ්‍ය අධිකාරීන් හරහා කරනු ලබන ලිඛිත ඉල්ලීම මත, නීතිය යටතේ ඇති ඉඩ කඩ ප්‍රකාරව අනුමත කළ හැකිය.

2. ගුවන් ගමනේදී යාත්‍රණය සිදු වන පාර්ශ්වයේ දේශයෙහි ගොඩබෑමක් නියමිතව නැත්නම් සංක්‍රමණය සඳහා අවසර ගැනීමක් අවශ්‍ය නොවේ. එම පාර්ශ්වයේ දේශය තුළ නියමිතව නැති ගොඩබෑමක් සිදු වේ නම් අනෙක් පාර්ශ්වය විසින් මෙම වගන්තියේ 1 වන ඡේදයේ සඳහන් පරිදි සංක්‍රාන්තිය සඳහා ඉල්ලීමක් කළ යුතු වේ. නියමිතව නැති ගොඩබෑමක් සිදු වේ නම් සංක්‍රාන්තිය සඳහා ඉල්ලීමක් ලැබී එම සංක්‍රාන්තිය බලපැවැත්වෙන තෙක් නියමිතව නොනිබූ ගොඩබෑම සිදු වී දින හතරක් (04) ක් (පැය 96) ක් තුල සංක්‍රමණය කරනු ලබන පුද්ගලයා රඳවා තබා ගැනීමට එම පාර්ශ්වයට පුළුවන.

16 වැනි වගන්තිය

පිරිවැය

1. උදර්පණය සඳහා කරනු ලබන ඉල්ලීම නිසා අවශ්‍ය වන අධිකරණ බලසීමාව තුළ කළ යුතු වන නීති කටයුතු පිළිබඳ පිරිවැය, ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් දැරිය යුතු වේ.

2. උදර්පණය කිරීමට සිටින පුද්ගලයා අත්අඩංගුවට ගැනීම හා රඳවා ගැනීම, දේපළ අත්පත් කර ගැනීම හා ආපසු භාරදීම සම්බන්ධයෙන් සිය දේශය තුළ දී සිදු වන වියදම් ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් දැරිය යුතුය.

3. උදර්පණය කිරීමට සිටින පුද්ගලයා ඉල්ලීම ලබන පාර්ශ්වයේ දේශයේ සිට ප්‍රවාහනය කිරීම පිළිබඳ වියදම් හා මාර්ගස්ථ වියදම්, ඉල්ලීම කරන පාර්ශ්වය විසින් දැරිය යුතුය.

17 වන වගන්තිය

මධ්‍ය බලධාරීන්

1. මෙම ගිවිසුමෙහි වෙනත් ආකාරයෙන් නියම කර නැත්නම් එහි කාර්යයන් පිළිබඳ තොරතුරු පාර්ශ්ව විසින් මධ්‍ය අධිකාරිය මඟින් කෙලින්ම හුවමාරු කර ගත යුතුය.

වියට්නාම් සමාජවාදී ජනරජය සම්බන්ධයෙන් මධ්‍ය අධිකාරිය වන්නේ මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශයයි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සම්බන්ධයෙන් මධ්‍ය අධිකාරිය වන්නේ ආරක්ෂක විෂය භාර අමාත්‍යාංශයයි.

2. ඕනෑම පාර්ශ්වයක මධ්‍ය අධිකාරියේ වෙනසක් සිදුවුවහොත් ඒ බව ප්‍රායෝගික වශයෙන් හැකි තරම් ඉක්මණින් රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ අනෙක් පාර්ශ්වයට දැනුම් දිය යුතුය.

18 වන වගන්තිය

ආරවුල් බේරුම් කිරීම

1. මෙම ගිවිසුම අර්ථකථනය කිරීමේදී, භාවිතා කිරීමේදී හෝ ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ආරවුල් අන්‍යෝන්‍ය වශයෙන් විසඳා ගැනීමට මධ්‍ය අධිකාරීන් විසින් උත්සාහ දැරිය යුතු වේ.

2. එම ආරවුල් අන්‍යෝන්‍ය වශයෙන් විසඳා ගැනීමට මධ්‍ය අධිකාරීන් අසමත් වුවහොත් ඒවා රාජ්‍යතාන්ත්‍රික මාර්ග තුළින් විසඳා ගත යුතුය.

19 වන වගන්තිය

උපදෙස් ලබා ගැනීම

1. ඕනෑම පාර්ශ්වයක ඉල්ලීම පරිදි මෙම ගිවිසුම අර්ථකථනය කිරීම හා භාවිතා කිරීම සම්බන්ධයෙන් පාර්ශ්ව විසින් උපදෙස් ලබා ගත යුතුය.

2. පෞද්ගලික ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම සහ මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා වන කාර්ය උපාය නඩත්තු කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ කටයුතු වල විරස්ථිතිය පිළිබඳව වියට්නාමයේ සමාජවාදී ජනරජයේ මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශයට හා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක අමාත්‍යාංශයට අන්‍යෝන්‍ය වශයෙන් උපදෙස් ලබා ගත හැකිය.

20 වන වගන්තිය

වෙනත් ජාත්‍යන්තර ගිවිසුම් යටතේ බැඳීම්

පාර්ශ්වකරුවන් වෙනත් ජාත්‍යන්තර ගිවිසුම්වල පාර්ශ්වකරුවන් වන කල්හි එම ගිවිසුම්වලට අදාළව ඔවුන් සතුව ඇති අයිතිවාසිකම් හා බැඳීම් කෙරෙහි වර්තමාන ගිවිසුමෙන් බලපෑමක් සිදු නොවිය යුතුය.

21 වන වගන්තිය

සංශෝධන

පාර්ශ්වවල එකඟතාවයෙන් මෙම ගිවිසුමෙහි සිදු කරනු ලබන සංශෝධන හා විකරණයන් ගිවිසුම මෙන්ම බලාත්මක විය යුතුය.

22 වන වගන්තිය

බලාත්මක වීම හා අවසාන වීම

1. මෙම ගිවිසුම එක් එක් පාර්ශ්වයේ නීති යටතේ තහවුරු කිරීම් වලට යටත් විය යුතුය. එය බලාත්මක වීම සඳහා අවශ්‍ය වන නෛතික කාර්ය පටිපාටි නිම වූ විට ඒ බව එක් එක් පාර්ශ්වය විසින් ප්‍රායෝගික වශයෙන් හැකිතාක් ඉක්මණින්, රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ අනෙක් පාර්ශ්වයට දැනුම් දිය යුතුය. අවසාන නිවේදනය කරන දිනයේ සිට දෙවන මාසයේ පළමුවන දින මෙම ගිවිසුම බලාත්මක විය යුතුය.

2. මෙම ගිවිසුම අනිශ්චිත කාලයක් තුළ බලාත්මකව පවතිනු ඇත. එසේ වුවත් ගිවිසුම අවසන් කිරීම පිළිබඳ ලිඛිත නිවේදනයක් පාර්ශ්වවලින් ඕනෑම පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය වෙත යැවීමෙන් ගිවිසුම අවලංගු කළ හැකිය. එම නිවේදනය අනෙක් පාර්ශ්වය වෙත ලැබී හය (06) මාසයකදී ගිවිසුම අවසන් විය යුතුය.

3. ගිවිසුම අවසන් වුවත් ඒ ගැන නොසලකා ගිවිසුම අවසන් වන දිනට පෙර කරන ලද උදර්පණ ඉල්ලීම සම්බන්ධයෙන් මෙම ගිවිසුම අදාළ විය යුතුය. මීට සාක්ෂි පිණිස අදාළ ආණ්ඩු විසින් නිසි පරිදි බලය පවරා ඇති පහත අත්සන් කරන අය විසින් මෙම ගිවිසුමට අත්සන් තබන ලදි.

වියට්නාම්, සිංහල හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් සියලු පිටපත් සමාන සත්‍යවත් වන ආකාරයෙන් අනු පිටපතකින් යුතුව සකසා 2014 අප්‍රේල් මස ...07... දින කොළඹ දී අත්සන් තබන ලදී. අර්ථකථනයේදී යම් අපසාරිතාවක් වෙතොත් ඉංග්‍රීසි පිටපත වලංගුව පැවැතිය යුතුය.

වියට්නාම් සමාජවාදී ජනරජය
වෙනුවට

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
වෙනුවට